**ශීර්ෂය 008 - ජාතික පොලිස් කොමිෂන් සභාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 008 - ජාතික පොලිස් කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික පොලිස් කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 15 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ජාතික පොලිස් කොමිෂන් සභාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූනි 25 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ජාතික පොලිස් කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ජාතික පොලිස් කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු ය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හදුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 ජනවාරි 27 දිනැති අංක 01/2023 දරන අයවැය චක්‍රලේඛ ප්‍රකාරව වැය විෂයයන් 07 ක් හැර අනෙකුත් සියලුම පුනරාවර්තන වියදම් සඳහා වූ ප්‍රතිපාදනවල එකතුවෙන් සියයට 6 කට සමාන ප්‍රතිපාදන ප්‍රමාණයක් අවම වශයෙන් කපා හැරීම සඳහා සියලුම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන් විසින් කටයුතු කළ යුතු බව දන්වා තිබුණ ද, පොලිස් කොමිෂන් සභාව ඒ අනුව කටයුතුකර නොතිබුණි. | වැඩි වූ කාර්යභාරය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත 2023 වර්ෂය සඳහා ලබාදී නොතිබූ බැවින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් මු.රෙ.208 යටතේ ප්‍රතිපාදන ලබාගැනීම සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් පරිපූරක ප්‍රතිපාදන ලබා ගැනීමට සිදුවිය. කෙසේ වෙතත්, සියයට 2 ක ප්‍රතිපාදන ප්‍රමාණය අඩු කිරීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වාචික එකඟතාවය ලබාදුන් එම ප්‍රතිපාදන ප්‍රමාණය ITMIS පද්ධතිය තුළ සංශෝධනය කර නොතිබුණු බව දන්වා ඇත. | 2023 ජනවාරි 27 දිනැති අංක 01/2023 දරන අයවැය චක්‍රලේඛය ප්‍රකාරව රජයේ වියදම් වඩාත් අරපිරිමැසුම්දායි ලෙස භාවිතා කිරීම හා අත්‍යාවශ්‍ය නොවන වියදම් හැකිතාක් අවම කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | වැය විෂයයන් 5 ක් සඳහා මුදල් රෙගුලාසි 208 යටතේ එකතුව රු.5,755,825 ක් වූ අමතර ප්‍රතිපාදන සලසාදී තිබුණි. මේ යටතේ වෙනත් දීමනා (1003) සහ වෙනත් (1409) වැය විෂයය සඳහා පිළිවෙලින් රු.1,975,525 ක් හා රු.450,000 ක අමතර ප්‍රතිපාදන සලසාගෙන තිබුණ ද, එයින් | කාර්ය මණ්ඩලය සඳහා වැටුප් හා දීමනා ගෙවීමට අවශ්‍ය ප්‍රතිපාදන රු. 1,975,525 ක් මු.රෙ. 208 යටතේ වැය විෂයය අංක 1003 සඳහා ලබාගත්ත ද, එම ප්‍රමාණය මුළුමනින්ම අවසන් විය. 1003 හා 1409 වැය විෂයය යටතේ වර්ෂය අවසාන | ප්‍රතිපාදන අවශ්‍යතා නිශ්චිතව හඳුනාගෙන ප්‍රතිපාදන මාරු කිරීම් සිදුකළ යුතු ය. |

| | | |
|---|---|---|
| පිළිවෙලින් රු.475,000 ක් හා රු.384,000 ක් වෙනත් වැය විෂයයන්ට මාරුකර තිබුණි. | වින විට ඉතිරි වේ යැයි අපේක්ෂිත ප්‍රතිපාදන ප්‍රමාණය ප්‍රතිපාදන අත්‍යාවශ්‍යව පැවති වැය විෂයයන් සඳහා මු.රෙ. 66 යටතේ මාරු කරන ලදී. | |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබානොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහජන පැමිණිලි විමර්ශනය | | |
| (i) | 2023 වර්ෂයේ ලද මහජන පැමිණිලි 2448 න් මහජන පැමිණිලි 1887 ක එනම් සියයට 77 ක විමර්ශන අවසන්කර නොතිබුණි. පළාත් අනුව ලද මහජන පැමිණිලි විමර්ශනය තුළින් වර්ෂය තුළ අවම වශයෙන් සියයට 25 ක ප්‍රගතියක් ලබාගැනීමට නොහැකි වූ පළාත් ගණන 8 ක් විය. | 2023 වර්ෂය තුළ ලැබී ඇති මහජන පැමිණිලි 561 ක් සමඟ 2016 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ලැබී ඇති මහජන පැමිණිලි 1090 ක විමර්ශන ද 2023 වර්ෂය තුළදී අවසන්කර ඇත. ඌව පළාතට අදාළව මහජන පැමිණිලි 129 ක් ලැබී ඇති අතර, ඉන් 14 ක විමර්ශන අවසන්කර ඇත. ඉතිරි පැමිණිලි සංඛ්‍යාවෙන් පැමිණිලි 102 ක් සඳහා ඌව පළාත් කාර්යාලය මගින් සහ පැමිණිලි 08 ක් සඳහා ප්‍රධාන කාර්යාලය මගින් පොලිස් විමර්ශන වාර්තා කැඳවා ඇත. | මහජන පැමිණිලි විමර්ශනය කිරීම ප්‍රශස්ථ මට්ටමට පත්කරගත යුතු ය. |
| (ii) | ලද මහජන පැමිණිලි ස්වභාවය අනුව මුළු පැමිණිලිවලින් වැඩිම ප්‍රතිශතයක් වූයේ පොලීසිය විසින් ක්‍රියා නොකිරීම, බලය අයථා ලෙස පරිහරණය, පක්ෂග්‍රාහී වීම යන ස්වභාවයේ පැමිණිලි වූ අතර, එය මුළු සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 33, 30 හා18 ක් පමණ විය. එම පැමිණිලි විමර්ශන අවසන් කිරීමේ ප්‍රගතිය පිළිවෙලින් සියයට 24, 25 හා 17 ක අඩු ප්‍රතිශතයක පැවතුණි. | මහජන පැමිණිලි ලැබෙන දිනය අනුව විමර්ශන ආරම්භ කර කටයුතු කර ඇති අතර, පැමිණිල්ලේ ස්වභාවය අනුව වර්ග කර විමර්ශන අවසන් කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම මෙතෙක් සිදු කර නොමැති වුවත්, පැමිණිලිවල ස්වභාවය අනුව ප්‍රමුඛතාවය ලබාදී විමර්ශන කටයුතු අවසන් කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදීමට කටයුතු කරන බව දන්වා ඇත. | මහජන පැමිණිලි විමර්ශනය කිරීම ප්‍රශස්ථ මට්ටමට පත්කරගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2023 දෙසැම්බර් 31 දින වන විට ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විභාග වෙමින් පවතින නඩු 216 ක් පවතින අතර, ඊට අමතරව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය යටතේ ක්‍රියාත්මක ගොනු 596 ක් පැවති අතර, ඉන් 99 ක් සඳහා පමණක් නිරීක්ෂණ ලබාදී තිබුණි. | එකී නඩු සම්බන්ධයෙන් අවසන් තීරණය ගරු ශ්‍රේෂ්ඨාධිකරණය හෝ අභියාචනාධිකරණය විසින් ලබාදිය යුතු වේ. නිරීක්ෂණ ලබා නොදුන් නඩු සම්බන්ධයෙන් කඩිනමින් නිරීක්ෂණ ලබාදීමට විශේෂ වැඩපිළිවෙලක් සකස්කර ක්‍රියාත්මක කරන බව දන්වා ඇත. | විභාගවෙමින් පවතින නඩු සම්බන්ධයෙන් අවශ්‍ය නිරීක්ෂණ කඩිනමින් ලබාදීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) | 2023 වර්ෂයේ ආරම්භ කළ විනය ගොනු 150 න් 53 ක තීරණ ලබාදී ඇති අතර, එහි ප්‍රගතිය සියයට 35 ක් පමණ විය. ඉන් සහකාර පොලිස් අධිකාරීවරුන් සම්බන්ධව ඉහළම විනය කටයුතු සම්බන්ධ පැමිණිලි 82 ක් ලැබී ඇති අතර, ඉන් 23 ක් පැමිණිලි සඳහා තීරණ ලබාදීම මත ප්‍රගතිය සියයට 23 ක අඩු අගයක් ගෙන තිබුණි. | විනය පරීක්ෂණ නිලධාරීන් පොලිස් නිලධාරීන්ගේ විමර්ශන කටයුතු භාරගැනීමට මැලිකමක් දැක්වීම මෙන්ම, ඒකී පරීක්ෂණ නිලධාරියෙකු විසින් විනය පරීක්ෂණ ගණනාවක් සිදු කිරීම නිසා පරීක්ෂණ නිලධාරීන් පත්කර ගැනීමට බොහෝ කාලයක් ගත වීම, වාර්තා ප්‍රමාද වීම ප්‍රගතිය අඩු වීමට හේතු වී ඇති බවත්, විනය පරීක්ෂණ ගොනුවල කාර්යයන් සම්පූර්ණයෙන් අවසන් නොවුව ද එම ගොනුවල කටයුතු සිදු කරමින් පවතින බව දන්වා ඇත. | විනය කටයුතු සම්බන්ධ පැමිණිලි කඩිනමින් විභාගකර තීරණ ලබාදිය යුතු ය. |

### 3.2 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2023 වර්ෂයේදී වාහන 03 කට අනතුරු සිදුවී තිබුණ ද, මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව එම හානි සම්බන්ධයෙන් හානි පිළිබඳ ලේඛනයේ සටහන්කර නොතිබූ අතර, හානියේ වටිනාකම සහ එම හානිය රක්ෂණයෙන් ප්‍රතිපූරණය කිරීම පිළිබඳ තොරතුරු අනාවරණය නොවුණි. | එක් අනතුරක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ සිදුකළ ද ප්‍රමාද දෝෂයකින් හානිපාඩු ලේඛනයේ ඇතුළත්කර නැති බවත්, අනෙකුත් අනතුරු 2 සම්බන්ධන් මු.රෙ.10 හා 104 ප්‍රකාරව කටයුතු කිරීමට සමීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇති බවත්, එම වාර්තා ලද වහාම විගණනය වෙත ඉදිරිපත් කරන බවත් දන්වා ඇත. | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි සම්බන්ධයෙන් හානි පිළිබඳ ලේඛනයේ සටහන් කළ යුතු ය. |

### 3.3 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූලස්ථාන පොලිස් පරීක්ෂක/ පොලිස් ස්ථානාධිපති තනතුරු සඳහා සුදුසු නිලධරයන් තෝරාගැනීමේ සම්මුඛ පරීක්ෂණයක් 2023 වර්ෂයේ පවත්වා තිබුණ ද, පොලිස්පතිගේ අංක DIG/HRM/OW/127/224 හා 2024 පෙබරවාරි 05 දිනැති ලිපියේ කරුණු සැලකිල්ලට ගෙන 2024 පෙබරවාරි 15 දින කොමිෂන් සභා තීරණය මත එම සම්මුඛ පරීක්ෂණය අවලංගු කිරීමට තීරණයකර තිබුණි. මෙම තත්ත්වය තුළ 2023 හා 2024 වර්ෂයේ මේ දක්වා සිදුකර තිබූ මූලස්ථාන පොලිස් පරීක්ෂක/පොලිස් ස්ථානාධිපති පත්වීම්වලට අදාළව නිලධාරීන් තෝරා ගැනීමේදී විධිමත් ක්‍රියාපටිපාටියක් අනුගමනයකර නොතිබූ අතර, මූලස්ථාන පොලිස් පරීක්ෂක/ ස්ථානාධිපති තනතුරු සඳහා සුදුසුම නිලධාරීන් පත් නොවීමට අවස්ථාව පැවතුණි. | DIG/ HRM/ OW/ 11127/ 2024 දරන 2024/02/05 දිනැති ලිපිය මඟින් 2023 වර්ෂයේ පැවැති වූ පොලිස් ස්ථානාධිපති තනතුරු සඳහා සුදුසු නිලධරයන් තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය අවලංගු කරන ලෙස නිර්දේශ කරමින් පොලිස්පති විසින් කර ඇති ඉල්ලීම සඳහා සියලු කරුණු සලකා බැලීමෙන් අනතුරුව අනුමැතිය ලබාදීමට 2024/02/15 දින රැස් වූ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් තීරණය කරන ලද බව 2024/02/20 දින පොලිස්පතිට දන්වා ඇත. | විධිමත් ක්‍රියාපටිපාටියකට උසස්වීම් හා තනතුරු ලබාදීමට කටයුතු සිදුකළ යුතු ය. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කොමිෂම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිතකර නොතිබූ බැවින්, සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණක තනතුර සඳහා නිලධාරියෙකු අනුයුක්ත කරන ලෙස පත්වීම් බලධාරියාගෙන් අවස්ථා ගණනාවකදී ඉල්ලුම් කළත්, නිලධාරියෙකු ලබානොදීම හේතුවෙන් අභ්‍යන්තර විගණන අංශයක ස්ථාපිත කිරීමට නොහැකි වී ඇති බව දන්වා තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (ආ)ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, අධ්‍යක්ෂ, ප්‍රධාන විමර්ශන නිලධාරී, අභ්‍යන්තර විගණක යන තනතුරු එක් නිලධාරියෙක් බැගින් පුරප්පාඩු වී තිබුණි. | දක්වා ඇති පුරප්පාඩු සංඛ්‍යාව නිවැරදි වන අතර, අදාළ පුරප්පාඩු කඩිනමින් පුරවන ලෙසත් එම පුරප්පාඩු හේතුවෙන් ආයතනයේ කටයුතු පවත්වා ගෙන යාම ගැටළු සහගත බවත්, අදාළ බලධාරීන් වෙත වරින් වර අවස්ථා ගණනාවකදී දැනුම්දී ඉල්ලීම්කර ඇති බව දන්වා ඇත. | කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කළ යුතු ය. |

(ආ) සහකාර අධ්‍යක්ෂ තනතුරු 08 ක් පුරප්පාඩුව පැවතුණි. කොමිෂන් සභාවේ විවිධ අංශයන් යටතේ මේ වන විටත් පවතින අවසන් නොවූ මහජන පැමිණිලි, අභියාචනා හා විනය සම්බන්ධ ලිපිගොනු කඩිනමින් නිම කිරීම මගින් ප්‍රමාදය වැලැක්වීමටත්, කොමිෂන් සභාව පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීමට මෙම තනතුරු කඩිනමින් පිරවිය යුතු බවත් පුරප්පාඩු පැවතීම කොමිෂමේ කාර්ය සාධනයට දැඩි ලෙස බලපාන බවත් විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

දක්වා ඇති පුරප්පාඩු සංඛ්‍යාව නිවැරදි වන අතර, අදාළ පුරප්පාඩු කඩිනමින් පුරවන ලෙසත් එම පුරප්පාඩු හේතුවෙන් ආයතනයේ කටයුතු පවත්වා ගෙන යාම ගැටළු සහගත බවත් අදාළ බලධාරීන් වෙත වරින් වර අවස්ථා ගණනාවකදී දැනුම්දී ඉල්ලීම් කර ඇති බව දන්වා ඇත.

කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කළ යුතු ය.